දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය - 2014 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts Degree (External) Part I Examination - February/March 2014

ඉසා 2.1 - ශ්‍රී ලංකා ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1796 දක්වා)
HYG 2.1 - History of Sri Lanka (From 1500 AD. to 1796 AD.)

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

01. "ප්‍රතිකාල් බල ව්‍යාප්තියට සුදුසු තෝතැන්නක්" 16C මුල් කාලයේ ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන තත්ත්වය පැහැදිලි කිරීමට මේ කෙතෙක් සාධාරණ දැයි පැහැදිලි කරන්න.

02. "16C මෙරට සිටි උපායශීලී බලවතා" සීතාවක මායාදුන්නේගේ ක්‍රියා කලාපය පිරික්සීමේ දී මෙය කෙතරම් උචිත නිගමනයක් දැයි පරීක්ෂා කරන්න.

03. "1594 වන විට ශ්‍රී ලංකාව මුහුණ පෑ දේශපාලන අර්බුදය හමුවේ I විමලධර්මසූරිය රාජප්‍රාප්තිය විසඳුමක් මෙන් ඉදිරිපත් විය." සාකච්ඡා කරන්න.

04. ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් හා උඩරට රජු සමඟ ඇති වූ ගිවිසුම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් 1638 සිට 1658 දක්වා කාලය තුළ II රාජසිංහ රජු ගෙන ගිය ප්‍රතිකාල් විරෝධී ක්‍රියාමාර්ග සමාලෝචනය කරන්න.

05. "1766 දක්වා කාලය තුළ උඩරට හා ලන්දේසින් අතර පැවති රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා කඩවත්, වරාය විවෘත කිරීම හා වැසීම මත වෙනස් විය." පරීක්ෂා කරන්න.

06. ලන්දේසි පාලනය යටතේ ස්වදේශිය පාලන තන්ත්‍රයේ ඇතිවූ වෙනස්කම් පරීක්ෂා කරන්න.

07. නායක්කාර රජවරුන් යටතේ උඩරට රාජධානිය තුළ ඇතිවූ වෙනස්වීම් පැහැදිලි කරන්න.

08. "18C අවසාන කාලයේ මුහුදුබඩ පළාත්වල ඇතිවූ බෞද්ධ ආගමික පුනරුදයේ නිර්මාතෘවරුන් වූයේ ගණින් වහන්සේලාය." ඔබ ඉහත ප්‍රකාශයට එකඟවන්නේ දැයි සහේතුකව හේතු දක්වන්න.

******************************